# රටේ ආර්ථික හා සංවර්ධනය නව මාවතක් කරා යොමුකරවීමට කාලයයි

වසර 33 ක් ලොව පුරා ''වොෂින්ටන් එකඟතාවය'' යටතේ ක්‍රියාත්මක කළ නව ලිබරල් ආර්ථික න්‍යායය වෙනස් කළ යුතු බව එය ක්‍රියාත්මක කළ ප්‍රධාන ජාත්‍යන්තර මූල්‍ය ආයතන වල ප්‍රධානීන් දැන් පිළිගෙන ඇත. මේ අතර IMF නායකව සිටි ඩොමිනික් ස්ට්‍රවුස් ඛාන් (Dominique Strauss Khan) 2011 වොෂින්ටන් හි කළ ප්‍රකාශය, ලෝක බැංකුවේ සභාපති ව සිටි ජේම්ස් වුල්ෆන්සන් (James Wolfenshan) 1997 නැගෙනහිර ආසියානු මූල්‍ය අර්බුදය නිසා කළ ප්‍රකාශය ලෝක බැංකුවේ ප්‍රධාන ආර්ථික උපදේශකව සිට ඉල්ලා අස්වී " Globalization and It's Discontents " පොත ලියු ජෝශප් ස්ටිග්ලිට්ස් (Joseph Stieglitz) හා නැගෙනහිර ආසියානු මූල්‍ය අර්බුදයට මුල පිරූ ජෝර්ජ් සෝරෝස් ආදින් ගේ ප්‍රකාශයන් විය.

1990 සියැටල් හී පැවති G-8 විරෝධි දැවැන්ත උද්ඝෝෂණයේ පටන් මේ දක්වා ගෝලීයකරණය ඉදිරියට ගෙනයාමට උත්සහ කළ සෑම ලෝක සමුළුවකටම එරෙහිව අතිවිශාල මහජන උද්ඝෝෂණ පැවතින. ලෝක වෙළෙඳ සංවිධානය (WTO) සම්මුතීන් ලෝක විරෝධය හා අභ්‍යන්තර මතභේද නිසා ඉදිරියට ගෙන යා නොහැකිව ඇත. ගෝලීයකරණයට එරෙහිව පැවැත්වෙන ''ලෝක සමාජ සමුළුව'' ලෝක ව්‍යාප්ත දැවැන්ත ව්‍යාපාරයකි.

මේ අතර අද ලෝකයේ මූල්‍ය ක්‍රමය විසඳාගත නොහැකි අර්බුදයක් වී ඇත. ලෝකයේ සාගින්නෙන් පෙළෙන සංඛ්‍යාව මිලියන 840 සිට අඩකින් අඩුකිරීමට ඇති කරගත් සහස්‍රකයේ සංවර්ධන ඉලක්කයන් (MDGs) අසාර්ථක වී ඇත. සාගින්න

බිලියන 1.2 දක්වා වැඩි වී තිබේ. 2009 දී FAO සංවිධානය පැවැත්වූ ලෝක ආහාර සමුළුවේ අරමුණ වුයේ 2050 දී බිලියන 9 ක් (කෝටි 9000 ක්) වන ලෝක ජනගහනයට ආහාර සැපයීම සඳහා මාර්ගයක් සකසා ගැනීමය. එය අසාර්ථක විය. 2011 මාර්තු මස එක්සත් ජාතීන්ගේ ආහාර අයිතිය පිළිබඳ විශේෂ වාර්තාකරු වන ඔලිවියර් ඩි ක්ෂුටර් (Oliver De schutter) එ. ජාතික මානව හිමිකම් මණ්ඩලයට විශේෂ වාර්තාවක් ඉදිරිපත් කරමින් කියා සිටියේ ලෝකයේ සාගින්න නිවීම කළ හැක්කේ කෘෂි පරිසර විද්‍යාව (Agro - Ecology ) යොදාගැනීමෙන් බවය.

2008 දී ලෝකයේ ඉහළම විද්‍යාඥයින් 400 ක් විසින් වසර 4 ක් පුරා රටවල් රාශියක අධ්‍යයනය කොට නිකුත් කළ ''සංවර්ධනය සඳහා කෘෂිකර්ම ඥානය, විද්‍යාව හා තාක්ෂණය යොදාගැනීම ගැන ජාත්‍යන්තර තක්සේරුවක්'' (IAASTD – International Assessment of Agriculture Knowledge Science and Technology for Development) නම් අධ්‍යයනයෙහි කියා සිටියේ කෘෂිකර්මය විසින් පරිසරයට කරන බලපෑම හා එහි සමාජයීය පැත්ත නොතකා සිටීමෙන් බරපතළ වරදක් කර ඇති බවය. ජාන වෙනස් කළ ආහාර නිපදවීම, ජීව ඉන්ධන ( Agro-Fuel ) නිපදවීම වැනි ක්‍රම නිෂ්ඵල හා හානිදායක වන බවයි. කාළගුණ විපර්යාස පිළිබඳව බොලිවියාවේ පැවති දැවැන්ත ජාත්‍යන්තර සමුළුවක දී සම්මත කොටගත් '' මිහිමවගේ අයිතීන්'' (Rights of Mother Earth) ප්‍රඥප්තිය සමස්ත ධනවාදී ක්‍රමයට එරෙහිව පාරිසර හිතවාදී මාවතක් ඉල්ලා සිටී. මෙය නීතිගත කිරීමට එරට පියවර ගෙන ඇත.

ශ්‍රී ලංකාවේ පසුගිය වසර 30 ක අත්දැකීම් තුලින් ඔප්පු වී ඇත්තේ නව ලිබරල් පෞද්ගලීකරණ උපාය මාර්ගය අසාර්ථක වී ඇති බවත්, එය තවදුරටත් ඉදිරියට ගෙනයාම සඳහා ''යළි පුබුදමු ශ්‍රී ලංකා'' වැනි උපාය මාර්ග අනුගමනය කිරීම තුලින් සියලු ජනතා අයිතීන් උල්ලංඝනය වීමත් සොබාදහම

විනාශවීමත්, නිරෝගීභාවය හා ආහාර අහිමිවීමත් උග්‍රවන බවත් ය.

එබැවින් මෙම පිළිවෙත නිසා මහජන විරෝධයට ලක්වන ආණ්ඩු එක්කෝ දැඩි ප්‍රජාතන්ත්‍ර විරෝධී, මර්දනකාරී පාලනයන් ගෙනයාම හෝ පරාජයට පත්වීම සිදුවිය. 1994 චන්ද්‍රිකා බලයට පත්වූයේ පෞද්ගලීකරණයට එරෙහි පොරොන්දු දෙමිනි. ''යළි පුබුදමු ශ්‍රී ලංකා'' ගිවිසුම ඉදිරිපත් කර වේගවත් කිරීමට උත්සහ කළ රනිල් වික්‍රමසිංහ අගමැතිව සිටි ආණ්ඩුව වසර 2 කින් බලයෙන් විසිවිය.

මහින්ද රාජපක්ෂ බලය ලබාගත්තේ ඉහත කී නව ලිබරල් ප්‍රතිපත්තිවලට බෙහෙවින් වෙනස් ''මහින්ද චින්තනය'' යටතේ විය. මෑත වසර වල දී මැතිවරණ දිනාගැනීම හා බලයේ සිටීම සඳහා ඔහු විසින් ප්‍රකාශ කොට ඇති, ''අපි වවමු, රට නගමු, ගම නැගුම, ගැමි දිරිය, දිවි නැගුම'' ආදී සැලසුම් ඉහත කී පෞද්ගලීකරනය හා නව ලිබරල් ආර්ථික සැලසුම් වලට මුළුමනින්ම වෙනස් වූ පිළිවෙත්ය.

මේ සියල්ලෙන් ප්‍රකාශවන්නේ ශ්‍රී ලංකාවේ තත්ත්වයන්, ලෝක තත්ත්වයන්, වර්තමානය හා අනාගතය සලකා බැලීමේ දී රටේ දිළිඳුභාවය හා සාගින්න දුරුකිරීම සඳහාත්, මානව හා ප්‍රජාතන්ත්‍ර අයිතීන් රැකගැනීම සඳහාත් අප විසින් කළ යුතු වන්නේ ණයට ගන්නා ජාත්‍යන්තර ප්‍රාග්ධනය මත රැඳීම නොව, ජනතාවගේ දායකත්වය, නිර්මාණාත්මක භාවය උපයෝගී කොට ගනිමින්, එම සම්පත් විනාශ කිරීමෙන් තොරවූ චිරස්ථායී සංවර්ධන මාවතක් කරා මාරු වීම බව ය.

මෙය කළහැක්කේ කුඩා ඉඩම් වගා කරන ග්‍රාමීය ජනතාව, ඉඩම් අහිමි ශ්‍රමිකයින්, ස්ත්‍රීන්, වතුකම්කරු ජනතාව, තරුණයින් හා ධීවර ජනතාවගේ සක්‍රීය දායකත්වය තුල පමණි. ඒ සඳහා වන මාවතක් ජනතාව අතරින් ගොඩනගා ගැනීම කළයුතුය. කළ

හැකිය. රටේ ප්‍රජාතන්ත්‍ර අයිතීන්, සියලු ජනවර්ග වල අයිතීන්, ශ්‍රමිකයන් ගේ අයිතීන් රැකගැනීමේ මාර්ගය එයයි.

**සරත් ප්‍රනාන්දු**
**ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය**
**2011-02-06**